**ශීර්ෂය 304 - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---------------------------------------------------

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 06 (1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මෙම වාර්තාවේ 1.6.1(ආ) ඡේදයේ ඇතුලත් නිරීක්ෂණය අනුව, මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වී නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සිදු කරන ලද නිර්දේශයන් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ක්‍රියාත්මක කර ඇත.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-----------------------------------------

**1.6.1** **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණ** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (අ) දේපල, පිරියත හා උපකරණවල වටිනාකම භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් වාර්තාව අනුව රු.3,854,080,777 ක් වී තිබුණු නමුත් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය රු.138,334 ක් අඩුවෙන් රු.3,854,219,111 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාරයේ අවසන් ගිණුම් වාර්තාව හා සසඳා ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. | භාණ්ඩාගාරය විසින් වෙනත් ශීර්ෂයක් යටතේ ඇතුලත් කර තිබූ රු.138,334 ක් ඉවත් කර වටිනාකම දක්වා ඇත. |
| (ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් වත්කම් වර්ග 08 ක 2019 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙනඑන ලද ශේෂය රු. 252,557,831ක් වූවද 2018 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.62,983,121 ක් වීම නිසා ශේෂයන් අතර රු.189,574,710ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනසට හේතුව ගිණුම් ප්‍රකාශන මගින් හෙලිදරව් කළ යුතුය. | අවසන් ගිණුම් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 271/2019 අනුව සම්මත ආකෘති පත්‍රයන් බැවින් එම ආකෘතින් වෙනස් කොට දත්ත ඉදිරිපත් කිරීමට අපහසු බව දන්වා ඇත. |

| | | |
|---|---|---|
| (ඇ) දෙපාර්තමේන්තුව විසින් ඩොප්ලර් රේඩාර් පද්ධතිය ප්‍රසම්පාදනය වෙනුවෙන් 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා දරා තිබුණු රු.408,825,422 ක පිරිවැය ගිණුම්වලට ගෙන නොතිබුණු අතර ලෝක කාලගුණ විද්‍යා සංගමයේ භාරකාර අරමුදලේ පැවැති රු.322,926,702 ක මුදල 2019 දෙසැම්බර් මස නැවත කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි. 2019 දෙසැම්බර් 24 දින ලද එම මුදලින් දෙපාර්තමේන්තුව වෙත රු.1,000,000 රඳවාගෙන ඉතිරිය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. එමෙන්ම 2016 ජනවාරි මස කුලුනේ තිබුණු රු.9,146,765 ක් වටිනා උපකරණද නැතිවී තිබුණි. මෙම ගණුදෙනු සම්බන්ධ කිසිදු සටහනක් මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම වත්කම් හා ගනුදෙනුව මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. | ඒ ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් බැවින් රු.මි.1 ක මුදලක් රඳවාගෙන ඉතිරිය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කරන ලද බව හා එවකට ඩොලරයෙහි වටිනාකම රු.110 ක් වූ අතර වර්තමාන වටිනාකම රු.179 ක් වීම මත ශේෂව පැවති මුදල රු.මිලියන 322ක් වූ බව |

### 1.6.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 ට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.138,922 ක ණය ශේෂය හා වර්ෂයකට ප්‍රථම මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.97,166 ක ණය ශේෂය අයකර ගැනීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය මත කපා හැරීමට කටයුතු කළ යුතුය. | ණය අයකර ගැනීමට අදාල ක්‍රියාමාර්ග සිදු කරමින් පවතින බව හා මියගිය නිළධාරියාගේ මරණ පාරිතෝෂිතයෙන් අයකර ඇති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් 2020 මාර්තු 12 දින දැනුම් දී ඇත. |

### 1.6.3 නීතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නිරීක්ෂණ | | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | රු. | | | |
| මුදල් රෙගුලාසි 571 | 179,935 | අවුරුදු 02 ක් ඉක්ම වූ තැන්පතු අවස්ථාවෝචිත පරිදි අදාල ගිණුමට හෝ රජයේ ආදායමට හෝ බැර කළ යුතු වුවත් එසේ කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කරමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා මුළු ශුද්ධ වෙන්කිරීම් රු.522,320,000 ක් වූ අතර ඉන් රු.331,770,294 ක් හෙවත් සියයට 64 ක් උපයෝජනය කර තිබුණි. මනා අධ්‍යනයකින් තොරව ප්‍රතිපාදන සලසා ගැනීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක රු.155,280,000 ක ප්‍රතිපාදන සියයට 40 සිට සියයට 100 දක්වා පරාසයක් තුල ඉතිරිවීම් විය. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී නිවැරදි මූල්‍ය අවශ්‍යතාවයන් හඳුනා ගැනීමටත් ලැබී තිබුණු ප්‍රතිපාදන විචක්ෂණව උපයෝජනය කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. | ඇතැම් ව්‍යාපෘති නිමකර ආදාල බිල්පත් පියවා අවසාන කිරීමට අපොහොසත් වීම නිසා ප්‍රතිපාදන ඉතිරිවි ඇත. |

| | | |
|---|---|---|
| (ආ) වැය විෂයයකට වෙන්කරන ලද මුදලින් රු. 12,930,383 ක් ඉතිරිව තිබියදී පරිපූරකයක් මගින් රු.28,250,000 ක් වෙන්කර තිබුණි. එම වැය විෂයය යටතේ රු.41,180,383 ක් එනම් සියයට 81 ක් ඉතිරිවී තිබුණි. | මුදල් රෙගුලාසි 50 හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | පිළිතුර ලබා දී නොමැත. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

-------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු.549,071 ක් වූ බැරකම් 07 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | බැරකම් නිවැරදිව ගණනය කළ යුතුය. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට ගෙවීම් සඳහා ඉදිරිපත්ව තිබූ බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර ඇති බව |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 ප්‍රසම්පාදනයන්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ලෝක කාලගුණ විද්‍යා සංගමයේ නිර්නායකයට අනුව කාලගුණ විද්‍යා තොරතුරු ලබා ගැනීම සඳහා 2020 වර්ෂය වන විට රසදිය කාරක උපකරණ වෙනුවට ස්වයංක්‍රිය කාලගුණ විද්‍යා උපකරණ භාවිතා කිරීමට අනුගත විය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා වූ දායකත්වය සැලකියයුතු මට්ටමක නොපවතින බව නිරීක්ෂණය විය. ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා පද්ධතිය සම්බන්ධ කර තිබුණු චන්ද්‍රිකාව පෘථිවි කක්ෂයෙන් | ස්වයංක්‍රීය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන නිසියාකාරව නඩත්තු කර ක්‍රියාත්මක තත්වයට ගත යුතු අතර සන්නිවේදන සම්බන්ධතා නියමිත දිනට ලබා ගැනීමට කටයුතු කළ යුතුය. කොන්ත්‍රාත්වලට එළඹීමේදී විධිමත් ගිවිසුමක් මත අදාළ ලංසු සුරක්ෂණයක් ලබා ගැනීමෙන් ප්‍රසම්පාදන පරිපාලනය පිළිබඳ කටයුතු විධිමත් කළ යුතුය. | රසදිය උපකරණ වෙනුවට විද්‍යුත් සංවේදක භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. නමුත් සන්නිවේදන සබඳතා ක්‍රමවත් නොවීම නිසා යම් පසු බෑමකට ලක්ව ඇත. ආදාල ප්‍රසම්පාදන කටයුතුවලදී ගිවිසුමක් අත්සන් කර ඇති නමුත් එය විධිමත් ගිවිසුමක් බව කිව නොහැක. |

| | | |
|---|---|---|
| බැහැරව පැවතීම නිසා IP/VPN සන්නිවේදන තාක්ෂණය ලබා ගැනීමට ප්‍රසම්පාදන කාර්යය පවරා තිබුණු Dialog Axita ආයතනය විසින් වර්ෂ $2\frac{1}{2}$ ක් ගත වී තිබුණ ද, එම ප්‍රසම්පාදන කාර්යය සම්පූර්ණ කර නොතිබුණි. එම ප්‍රසම්පාදන කාර්යය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 පරිදි ලියා අත්සන් කළ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක්ද නොපැවතුණි. | | |
| (ආ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් හයිඩ්‍රජන් ජෙනරේටරයක් මිලදී ගැනීමට 2018 වර්ෂයේදී මිල ගණන් කැඳවා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් පසු විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් නොකිරීම හා මිලදී ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් 2019 වර්ෂයේ ප්‍රතිපාදනය වූ රු.මිලියන 22.75 ක් ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි. පරිපූරක ඇස්තමේන්තු මගින් ද මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද , ප්‍රසම්පාදනයේ දුර්වලතා නිසා මිලදී ගැනිමේ කටයුතු සිදු කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව 2018 වර්ෂයේ රු.මිලියන 100 ක් හා 2019 වර්ෂයේ රු.මිලියන 45 ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. | ප්‍රසම්පාදන කටයුතු විධිමත්ව ඉටු කරමින් ප්‍රතිපාදන උපයෝජනය කළ යුතුය. | 2018 වර්ෂයේදි හයිඩ්‍රජන් ජෙනරේටරය මිලදී ගැනිමට නොහැකි විම නිසා 2019 වර්ෂයේදී අවසන් කිරිමට ප්‍රතිපාදන ලැබුණ ද ඒ වන විට ජෙනරේටරයේ මිල වැඩි විම නිසා මිලදී ගැනිමට නොහැකි විය. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිවයිනට හට ගන්නා වැසි තත්ත්වය හා අනුබද්ධ කාලගුණ තත්ත්ව වඩාත් හොඳින් නිරීක්ෂණය කිරීමට සහ අයහපත් කාලගුණය පිළිබඳ පූර්ව අනතුරු ලබාදීමේ ක්‍රමවේදයට පිටුවහලක් ලබා ගැනීමේ අරමුණින් ඩොප්ලර් රේඩාර් පද්ධතියක් | රේඩාර් කුළුනු ඉදි කිරීමේ කටයුතු ගිවිසුමට අනුකූලව ප්‍රමාදයකින් තොරව කිරීමටත් කුළුනු ඉදි කරනු ලබන කාලගුණ | රේඩාර් කුළුණු සඳහා විදුලි සැපයුම ලබා ගැනීමේ කටයුතු කරමින් පවතින අතර පොතුවිල් රේඩාර් කුළුණ ඉදිකිරිම් කටයුතු සිදු කරනු ලබන භූමිය පවරා ගැනීමට අදාල කටයුතු සිදු කර ඇති නමුත් |

| | | |
|---|---|---|
| පුත්තලම හා පොතුවිල් කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල පිහිටුවීම සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය විසින් ජපන් යෙන් 2,503,000,000 ක ප්‍රදානයක් ලබා දීම සඳහා 2017 ජුනි 30 දින ශ්‍රී ලංකා රජය අතර ගිවිසුමක් අත්සන් කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය මගින් රු.486,650,000 ක මුදලක්ද දැරිය යුතු වන අතර ව්‍යාපෘති වැඩ දියුණු කිරීමේ කාලය 2017- 2021 දක්වා බව ගිවිසුම අනුව නිරීක්ෂණය විය. ගිවිසුමට අනුව වර්තමානය වන විට රේඩාර් කුළුණු ඉදි කිරීම් කටයුතු අවසන් අවස්ථාවට ලඟා විය යුතු වුවද මේ වන විට ඉදි කිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි. ඒ අනුව ඉතිරි කටයුතු සියල්ලන්ගේම ප්‍රමාදයන් සිදු වී ඇති බවද තවදුරටත් නිරීක්ෂණය වේ. එමෙන්ම පොතුවිල් රේඩාර් කුළුණු ඉදි කිරීම් කටයුතු සිදු කරනු ලබන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමියද කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා නොතිබුණි. | විද්‍යා මධ්‍යස්ථානය පිහිටි භූමිය කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට පවරා ගැනීමටත් කටයුතු කළ යුතුය. | මෙතෙක් පවරා දී නැත. |

## 4. තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණද තිරසර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සකසා අවසන් කර නොතිබුණි. දත්ත ගබඩා කිරීමේ කටයුතු ද සිදු කර නොතිබුණි. තවද තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලඟා වීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමට හා ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. | තිරසර සංවර්ධන උපාය මාර්ගික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරිම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ රැස්වීමක් පැවැත්වීමට සැලසුම් කලද එය පැවැත්වීමට නොහැකි වූ අතර දැනුවත් කිරීම් කළ පසු ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කිරිමට කටයුතු කරනු ඇත. දත්ත රැස් කිරීම හා ගබඩා කිරීම ඉදිරියේදී සිදු කිරීමට නියමිතය. |

**5.** **යහපාලනය**

-------------

**5.1** **අභ්‍යන්තර විගණනය**

---------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත කාර්ය මණ්ඩලයේ අභ්‍යන්තර විගණක තනතුරක් ඇතුලත්ව තිබුණද 2013 වර්ෂයේ සිට 2019 ජුලි 01 දින දක්වා එම තනතුර පුරප්පාඩුව පැවතිණි. නිලධාරිනියක පත්කර තිබුන ද එම නිලධාරිනිය 2020 අප්‍රේල් 17 දින ස්ථාන මාරු වී ඇති බැවින් එදින සිට එම තනතුර පුරප්පාඩු වී ඇත. | විධිමත් පියවර ගත යුතු වීම. | අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කළ නිලධාරිනිය ස්ථාන මාරු වී ගිය බැවින් 2020 අප්‍රේල් 17 දින සිට අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී ඇත. |

**6.** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 460 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 361 ක් පැවති බැවින් පුරප්පාඩු 99 ක් පැවතුණි. දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුර, අධ්‍යක්ෂ තනතුරු 06 ක්, කාලගුණ විද්‍යාඥ තනතුරු 03 ක් සහ සිවිල් ඉංජිනේරු තනතුරක් ද ඒ අතර විය. | අත්‍යාවශ්‍ය තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. | අධ්‍යක්ෂ තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පලාත් හා පලාත් පාලන අමාත්‍යාංශය මඟින් පැවැත්වුවද ප්‍රතිඵල ලැබී නැත. අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ iii ශ්‍රේණියේ කාලගුණ විද්‍යා තනතුරු 08 ක් සඳහා පත්වීම් ලබා දී ඇති අතර එම නිලධාරින් අතරින් කාලගුණ විද්‍යා තනතුරු 03 ක් සම්පූර්ණ කිරිමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට ලිපි යොමු කර ඇත. |